# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2042/12 – 2017 ඔක්තෝබර් මස 24 වැනි අඟහරුවාදා – 2017.10.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා මිනින්දෝරු සේවා ව්‍යවස්ථාව කාර්යක්ෂමතා කඩඉම් පිළිබඳ (ආ) පරිශිෂ්ඨය සංශෝධනය කිරීම

2006 පෙබරවාරි මස 27 දිනැති හා අංක 1434/5 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද සහ 2007 ජනවාරි මස 31 දිනැති අංක 1482/17 දරන, 2007 අගෝස්තු මස 10 දිනැති අංක 1509/15 දරන, 2009 ඔක්තෝබර් මස 15 දිනැති අංක 1623/13 දරන, 2010 මැයි මස 20 දිනැති අංක 1654/13 දරන සහ 2010 ඔක්තෝබර් මස 12 දිනැති අංක 1675/20 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍ර* මගින් සංශෝධිත ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය, පහත දැක්වෙන ආකාරයට සංශෝධනය විය යුතු ය.

**(ආ) පරිශිෂ්ඨය**

***2 වන කාර්යක්ෂමතා කඩඉම***

II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ නිලධාරීන් 7 වැනි වැටුප් පියවරට එළැඹීමට පෙර පහත විෂය නිර්දේශය සහිත ලිඛිත පරීක්ෂණයක් වන 2 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතු ය. පහත ප්‍රශ්න පත්‍ර දෙක සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම ලකුණු 40ක් බැගින් ලබා ගත යුතු ය.

| | *ප්‍රශ්න පත්‍රයේ නම* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 1. | ඉඩම් නීතිය සහ ඉඩම් මැනීම | පැය 3 | 100 | 40 |
| 2. | ක්ෂේත්‍ර මැනුම් කළමනාකරණය | පැය 3 | 100 | 40 |



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(1) ඉඩම් නීතිය සහ ඉඩම් මැනීම - ඉඩම් නීතිය, ඉඩම් පරිපාලනය. නවීන මැනුම් තාක්ෂණ හා කැඩැස්තර මැනුම් සම්බන්ධ එක් ප්‍රශ්න පත්‍රයකි.

(2) ක්ෂේත්‍ර මැනුම් කළමනාකරණය - කළමනාකරණය හා කාර්යාල හා ක්ෂේත්‍ර කටයුතු සංවිධානය කිරීම සම්බන්ධ එක් ප්‍රශ්න පත්‍රයකි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

**එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2017 ඔක්තෝබර් මස 19 වැනි දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 177, නාවල පාර,
නාරාහේන්පිට,
කොළඹ 05.

11 – 435

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.